**අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල - 2021**

---

අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 2009 අංක 44 දරන අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877 (2)(ඇ) වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**2. විගණන නිරීක්ෂණ**

---

**2.1 විගණන කටයුතු සඳහා විධිමත් තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම**

---

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අම්බුළුවාව පරිශ්‍රය තුළ කාර්යාලයක් පවත්වා ගෙන ගිය ද ලේඛන හා පොත්පත් විධිමත් පරිදි පවත්වා නොතිබුණු අතර ඒ සඳහා බලය පැවරු වගකිවයුතු නිලධාරියෙකු කාර්යාලයේ සේවයේ යොදවා නොතිබුණි. එමෙන්ම භාරකාර මණ්ඩලය නියෝජනය කරන කිසිදු සාමාජිකයෙකු විගණනයට තොරතුරු ලබාදීම සඳහා ඉදිරිපත් නොවූ අතර, බලතල පැවරු ලිපියක් හෝ පත්වීම් ලිපියක් ලබාදී නොතිබුණු ඉදිකිරීම් උපදේශක , කළමනාකරු හා ගිණුම්කරණ සහායක විගණනයට තොරතුරු ඉදිරිපත් කරන ලදී. මේ නිසා සිදු කළ ගනුදෙනු සම්බන්ධයෙන් නිවැරදි, පැහැදිලි හා සම්පූර්ණත්වයෙන් යුතු තොරතුරු විගණනයට ලබා ගැනීමට නොහැකි විය. | පිළිතුරු ලබා දී නැත. | • බලය පැවරු වගකිව යුතු නිලධාරියෙකු කාර්යාලයේ සේවයේ යෙදවිය යුතුය.<br>• පොත්පත් විධිමත් පරිදි පවත්වා ගත යුතුය. |

**2.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල නමින් ගම්පොල ලංකා බැංකු ශාඛාවේ පවත්වාගෙන යනු ලබන රු.4,000,000 ක් වටිනා ස්ථාවර තැන්පත් 03 කට අදාළ ස්ථාවර තැන්පතු සහතික විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | පිළිතුරු ලබා දී නැත. | ස්ථාවර තැන්පතු සහතික ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | මධ්‍යම රජයේ සහ මධ්‍යම පළාත් සභාවේ වියදමින් අම්බුළුවාව පරිශ්‍රයේ සිදු කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් සහ වැව ප්‍රතිසංස්කරණය හා ඇවිදින මංතීරුව ඉදිකිරීමේ ව්‍යාපෘති දෙක සම්බන්ධයෙන් පිරිවැය ඇස්තමේන්තු , වියදම හෝ වෙනත් කිසිදු විස්තරයක් භාර අරමුදල සතුව නොතිබුණි. මේ නිසා එම සංවර්ධන ව්‍යාපෘති වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරිමට නොහැකි වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | සංවර්ධන ව්‍යාපෘති වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා නිකුත් කළ ඇතුළත්වීමේ අවසරපත්වල පිළිපත් ගිනි තබා විනාශ කර තිබුණි. එබැවින් එම කාලයට අදාළව ප්‍රවේශපත් විකිණීමෙන් ලද ආදායම සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හා තහවුරු කිරීමට නොහැකි විය. | පිළිතුරු ලබා දී නැත. | ලේඛණ හා පොත්පත් වල ආරක්ෂාව තහවුරු කළ යුතුය. |
| (ඈ) | විධිමත් ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමකින් තොරව අරමුදල සතු වාහනයක් රු.3,500,000 කට බාහිර පුද්ගලයෙකුට විකුණා තිබුණු අතර ඊට අදාළ ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පිළිතුරු ලබා දී නැත. | • විධිමත් ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය අනුගමනය කර විකිණීමට කටයුතු කළ යුතුය.<br>• විකිණීමට අදාළ සියළු තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | අරමුදල සතු එකතුව රු.9,130,000 ක ටොයෝටා වර්ගයේ මෝටර් රථය හා විදුලියෙන් ක්‍රියා කරන යතුරුපැදිය භෞතිකව පවතින බවට හා භාරයේ කටයුතු සඳහා යොදවාගත් බවට තහවුරු කිරීම සඳහා තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. එසේ වුවද මෝටර් රථය සඳහා සමාලෝචිත වර්ෂය තුළ | පිළිතුරු ලබා දී නැත. | භෞතිකව වාහන පවතින බවට හා අරමුදලේ කටයුතු සඳහා භාවිතා කළ බවට සනාථ කරන ලියවිලි ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අළුත්වැඩියා කටයුතු සඳහා රු.608,089 ක් ගෙවා තිබුණි. | | |
| (ඊ) | අම්බුළුවාව අරමුදල නමින් මහා භාරකාරවරයා යටතේ පවතින සියළු මුදල් හා අම්බුළුවාව පරිසර සංවර්ධන සහ සංරක්ෂණ භාර අරමුදල නමින් බැංකුවල පවතින මුදල් පිළිබඳ තොරතුරු හා ලේඛන, භාරය මගින් ලබාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | අරමුදල නමින් මහා භාරකාරවරයා යටතේ පවතින සියළු මුදල් හා අම්බුළුවාව පරිසර සංවර්ධන සහ සංරක්ෂණ භාර අරමුදල නමින් බැංකුවල පවතින මුදල් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (උ) | සුළු මුදල් ප්‍රතිපූර්ණය කිරිමේ අවස්ථා 03 කදී බිල්පත් වටිනාකම ඉක්මවා එකතුව රු.29,100 ක් හා අවස්ථා 8 කදී බිල්පත් රහිතව කාර්ය මණ්ඩලයේ තිදෙනෙක් වෙත රු.260,000 ක් ගෙවීම් කර තිබුණි. ඉන් අවස්ථා 02 කදි ගෙවීම් කරන ලද එකතුව රු.55,000 ක මුදල් ගෙවීම් සම්බන්ධයෙන් ආදායකයා පිළිබඳව තොරතුරු සනාථ නොවීය. | පිළිතුරු ලබා දී නැත. | සුළු මුදල් ප්‍රතිපූර්ණයට අදාළව බිල්පත් ඉදිරිපත් කළ යුතු අතර එම ගෙවීම් වල ආදායකයා පැහැදිලිව සඳහන් කළ යුතුය. |

## 2.3 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනා කාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත | සේවකයින් 13 සිට 18 අතර සංඛ්‍යාවක් සම්බන්දයෙන් සේවක අර්ථසාධක අරමුදල් පනත හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඊට අදාළ දායක මුදල් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------------- | | | |
| i | මුදල් රෙගුලාසි 137, 138, 237 හා 257 | බලය දීම, ගෙවීම් අනුමත කිරීම හා සහතික කිරීම නොකළ වවුචර් 231 ක් සඳහා රු.35,932,655 ක් ගෙවා තිබුණි. මෙම ගෙවීම් වලින් රු.2,743,460 ක ගෙවීම් සඳහා තොග සහතික ද ඉදිරිපත් නොකරන ලදී. | පිළිතුරු ලබා දී නැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. | මුදල් රෙගුලාසි 264 | සමාලෝචිත වර්ෂයේ ගෙවීම් වවුචර් 156 ක් මගින් ගෙවන ලද එකතුව රු.26,548,673ක් සම්බන්ධ යෙන් එම මුදල ලැබුණු බවට කුවිතාන්සි ආදායකයාගෙන් ලබාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ගෙවීම්වලට අදාළ කුවිතාන්සි ලබාගත යුතුය. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 ජේදය | සමාලෝචිත වර්ෂයේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අවස්ථා 4 කදී එකතුව රු.359,561 ක උපකරණ මිලදී ගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**2.4 මුදල් කළමනාකරණය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 387 විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ බැංකු අයිරා පහසුකම් ලබාගෙන රු.112,621 ක පොලී ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල සැපයුම්කරුවෙකුට ගෙවීම් කිරීමේදී මිලගණන් ඉදිරිපත් කළ ආයතනය වෙනුවට පුද්ගලයෙකුගේ නමට අවස්ථා 08 ක දී එකතුව රු.2,522,932 ක චෙක්පත් නිකුත් කර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | මිලගණන් ඉදිරිපත් කළ ආයතනයේ නමට චෙක්පත් නිකුත් කළ යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **දෘශ්‍ය අක්‍රමිකතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වය අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රවේශපත්‍ර හා වෙනත් ආදායම් ලැබීම් රු.21,466,760 කින් රු.20,834,871 ක් බැංකුවේ තැන්පත් කර තිබුණි. අතඉතිරි කරගෙන තිබුණු මුදලින් රු.143,400 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | මුදල් ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලසි 156 ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මස ප්‍රධාන දොරටුවෙන් ඇතුල් වූ නරඹන්නන් හා කුළුනට ඇතුල් වූ නරඹන්නන් සම්බන්ධයෙන් කළ පරීක්ෂාවේදී ප්‍රධාන දොරටුවෙන් ඇතුල් වූ සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් එම දිනයන්හිදී කුළුණට ඇතුල්වී තිබුණි.මේ අනුව ප්‍රධාන දොරටුවෙන් ප්‍රවේශපත්‍ර ලබා නොගෙන ඇතුළු වී ඇති බවක් නිරීක්ෂණය වුයෙන් නියැදි පරීක්ෂාවට අනුව ඉන් භාර අරමුදල වෙත රු.15,540 ක ආදායමක් අහිමි වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | අභ්‍යන්තර පාලනය වඩා ශක්තිමත් කළයුතු අතර අහිමි වූ ආදායම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාර අරමුදල් පනතේ 4 වන වගන්තියේ සඳහන් පුද්ගලයින්ගේ ක්‍රීඩා සහ විනෝද කටයුතු පිළිබඳ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීම, ගොවියන් ධෛර්යමත් කිරීම සහ ප්‍රජාව තුළ තරුණ ගොවි සංවිධාන පිහිටුවීම, අම්බුළුවාව කඳුපෙළ වටා ප්‍රදේශය වැඩි දියුණු කිරීම හා බුද්ධිමත්ව, බැංකුවල සහ වෙනත් මූල්‍ය ආයතනවල ආයෝජනයන් කිරීමට තැනැත්තන් උනන්දු කරවීම යන අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මෙම සංකීර්ණයට අයත් ඉඩම් 1998 වර්ෂයේ දී මිනුම් කර ඇති බවත්, එය අක්කර 400 කින් පමණ වපසරියකින් යුතු බවත් සඳහන් කෙරුණ ද ඊට අදාළ මිනුම් වාර්තා භාරය වෙත ලබාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | මිනුම් වාර්තා භාරය වෙත කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | භාරය සතු එක් අවන්හලක් 2020 මැයි මස සිට සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මස දක්වා කාලය තුළ බාහිර පුද්ගලයෙකුට බදු කුලී අයකිරීමකින් හා බදු ගිවිසුමකින් තොරව ව්‍යාපාර කටයුතු සඳහා ලබාදී තිබුණි. ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමකින් තොරව ව්‍යාපාරය පවත්වා ගෙන ගිය එම ව්‍යාපාරිකයා වෙතම සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මස සිට මාසිකව රු. 10,000 ක බදු මුදලකට ගිවිසුම් කාලයක් නොදක්වා 2022 ජනවාරි 05 දින ගිවිසුම් ගතව බදු පදනම මත එම අවන්හල ව්‍යාපාර කටයුතු සඳහා ලබාදී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කර විධිමත් බදු ගිවිසුමක් යටතේ ව්‍යාපාර කටයුතු පවරා බදු කුලී අයකළ යුතුය. |
| (ඈ) | අම්බුළුවාව පරිශ්‍රය තුළ පෞද්ගලික දුරකථන සමාගම් 04 කට දුරකථන සම්ප්‍රේෂණ කුටි ඉදිකර පවත්වාගෙන යාම සඳහා ඉඩ සලසා තිබුණ ද ඊට අදාළව ඇති කරගත් ගිවිසුම් කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දුරකථන සමාගම් 03 කින් දුරකථන කුටි බිම් කුලී ආදායම් එකතුව රු.1,033,000 ක් රැස් කරගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 16 දින භාරකාර මණ්ඩලය මගින් මෙම බිම්කුලී ආදායම සංශෝධනය සඳහා ලබාදුන් අනුමැතිය අනුව කටයුතු නොකිරීම නිසා රු.64,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | භාරකාර මණ්ඩල රැස්වීම් තීරණ ක්‍රියාත්මක කළ යුතු අතර ලැබිය යුතු ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලට අයත් අම්බුළුවාව සංචාරක බංගලාව සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය සඳහා කිසිදු අයකිරීමකින් හා ගිවිසුම් ගත වීමකින් තොරව බාහිර පුද්ගලයෙකු වෙත ලැගුම්හලක් පවත්වාගෙන යාම සඳහා | පිළිතුරු ලබා දී නැත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර විධිමත් බදු ගිවිසුමක් මත අරමුණුගතව පැවරිය යුතු අතර බදු කුලී නිසි පරිදි අයකරගත යුතුය. |

ලබාදී තිබුණි. පසුව සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මස සිට රු.55,000 ක මාසික කුලියක් අය කිරීමට තීරණය කර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.165,000 ක බදු කුලී අය කර ගෙන නොතිබුණි.

## 3.4 කොන්ත්‍රාත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිර්මාතෘගේ පිළිරුව ආශ්‍රිත භූමිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මිලගණන් කැඳවීමකින් තොරව හා ගිවිසුම්ගතවීමකින් තොරව අම්බුළුවාව උද්‍යාන පරිශ්‍රයේ ග්‍රැනයිට් සැපයීම, ඇල්ලීම සහ පොලිෂ් කිරීම, නව උද්‍යානයේ පොකුණු ආශ්‍රිතව වතුරමල් සපයා සවිකිරීම, ආලෝකකරණය හා භූමි අලංකරණය ඉටු කිරීම පුද්ගලයන් 09 ක් වෙත පවරා සමාලෝචිත වර්ෂයේ රු. 9,805,074 ක් ගෙවා තිබුණි. මෙම ඉදිකිරීම්වලට අදාළ මුළු පිරිවැය ඇස්තමේන්තු ඉදිරිපත් නොකෙරුණ අතර ඉංජිනේරුවෙකු හෝ තාක්ෂණික නිලධාරියෙකු විසින් ගෙවීම් බිල්පත් සහතික කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | මිලගණන් කැඳවා ගිවිසුම් ගතව ඉදිකිරීම් පවරා ඉංජිනේරු/තාක්ෂණ නිළධාරි වාර්තා අනුව ගෙවීම් කළ යුතුය |
| (ආ) | සෘජු ශ්‍රම පදනමින් ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු. 5,831,681 ක් වැයකර තිබුණ ද ඊට අදාළ මුළු පිරිවැය ඇස්තමේන්තු, වැඩ පත්‍රිකා (Job Sheet) සකස් කර නොතිබුණි. එමෙන්ම මිලදීගත් අමුද්‍රව්‍ය, තොග පොත්වල සටහන් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | සෘජු ශ්‍රම පදනමින් ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුළු පිරිවැය ඇස්තමේන්තු හා වැඩ පත්‍රිකා පවත්වා ගත යුතු අතර මිලදීගත් අමුද්‍රව්‍ය, තොග පොත් වලට ඇතුළත් කර නිකුත් කිරීම් කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දි භාර අරමුදල සතුව පවතින කළමනාකරණ බංගලාව වෙනුවෙන් රු.121,505 ක් හා පුස්තකාල ගොඩනැගිල්ල සභාපතිගේ නිල | පිළිතුරු ලබා දී නැත. | භාර අරමුදල සතුව පවතින වත්කම් උපයෝජනය සඳහා |

| | | | |
|---|---|---|---|
| | නිවස සඳහා භාවිතා කිරීමේ අරමුණින් රු.1,646,906 ක වියදමක් දරා අළුත්වැඩියා කර තිබුණ ද 2022 අගෝස්තු 31 විගණිත දින වන විටත් ඒවා උපයෝජනය කර නොතිබුණි. | | කටයුතු කළ යුතුය. |
| (ආ) | විගණිත දිනය වන විට රුපියල් 25,400,000 ක පොත් වටිනාකම වූ පුස්තකාලය, කැපටේරියා අංක 02 (අවන්හල) සම්මන්ත්‍රණ ශාලාව, සංචාරක බංගලාව අංක 02 ලෙස ගොඩනැගිලි 04 ක් සහ පිරිවැය වටිනාකම හෙළිදරව් නොකළ රංග ශාලාව, කළමනාකරණ නිවාසය, අපේක්ෂිත විශ්‍රාම ශාලාව හා කඩ කාමර 2ක් සමාලෝචිත වර්ෂයේ කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනයට කටයුතු කළ යුතුය. |

**3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන දොරටුවේ ප්‍රවේශ පත්‍ර ආදායම් ලේඛනය හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ යන්ත්‍රය මගින් ලබාගත් මාසික වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 06 කදී දෛනිකව රැස්කරන ලද ආදායමට වඩා එකතුව රු.127,140 ක් අඩුවෙන් ආදායම් ලේඛනයට ගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | දෛනිකව රැස්කරන ආදායම් නිවැරදිව ලේඛනගත කළ යුතුය. |

**3.7 අවිධිමත් කටයුතු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු. 3,726,540 ක වියදමක් දරා කඳු සහිත ස්ථාන තැනිතලා කරමින් පස් කැපීම හා ගල් කැඩීම නිසා අම්බුළුවාව පරිශ්‍රයේ ජෛව විවිධත්වයට හා පාරිසරික තත්ත්වයන්ට හානියක් සිදු වී තිබුණි. මෙම කටයුතු සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශයේ හා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ හා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශයේ හා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ හා අනුමැතීන් ලබා නොගෙන ජෛව විවිධත්වයට හානි වන ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමකින් තොරව හා ලිඛිත ගිවිසුමකින් තොරව භාරය සතු සම්මන්ත්‍රණ ශාලාව පෞද්ගලික සමාගමක් වෙත ව්‍යාපාරික කටයුතු සඳහා ලබාදී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | රජයේ ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය ප්‍රකාරව කටයුතු කළයුතුය. |